පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක එන්සීපී/2006/05

මගේ අංකය:- එන්සීපී/සීඑස්/පීටී/5/1/1
ප්‍රධාන ලේකම් කාරයාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.
2006.03

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් සභාවේ ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
සියලුම ගණකාධිකාරීවරුන් වෙත.

## දේපල ණය බැංකු මගින් ලබාදීම ගිණුම් තැබීම හා පොළිය බැංකුවට ප්‍රේෂණය කිරීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අයවැය චක්‍රලේක අංක 122 හා 122 (i) දිනැති ලිපි වලින් දී ඇති උපදෙස් වලට වැඩිමනත් වශයෙනි.

**02. ණය අයදුම් පත්‍ර අනුමත කිරීම**

මේ සම්බන්ධයෙන් මා විසින් ඔබ වෙත එවූ මගේ අංක එන්සීපී/සීඑස්/ඊඩී/10/1/1 හා 2005.04.25 දිනැති ලිපියේ 02 හා 04 ජේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

**03. පොළිය වෙනස සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම**

දේපල ණය වෙනුවෙන් බැංකුව විසින් 10% ක පොළියක් අයකරනු ලබන අතර, නිලධාරියාගෙන් 4% ක පොළියක්ද රජය වෙනුවෙන් බැංකුව 6% ක පොළියක් අයකරනු ලැබේ. නිවසක් තැනීමට අදාලව දේපල ණයක් බැංකුව විසින් අදාල ණය අයදුම් කරුට ගෙවීමේදි වාරික 03 කින් ගෙවීම් කරනු ලබන අතර, එකී වාරික 03 වෙනුවෙන් මාසිකව 10% ක පොළියක් නිලධාරියාගෙන් පළමුව අයකරනු ලැබේ. එකී ණය වාරික තුනම ගෙවීම් කර අවසන් වූ පසුව නිලධාරියාගෙන් අයකළ 6% ක පොළි මුදල එකී නිලධාරියාට ගෙවීම් කළ යුතුය. එකී ගෙවීම් කළ යුතු පොළිය පිළිබඳ පළාත් භාණ්ඩාගාරයට දැන්වූ පසුව ප්‍රතිපාදන පළාත් භාණ්ඩාගාරයෙන් වෙන් කර දෙනු ලැබේ.

2006 වර්ෂය තුළ බැංකුව ගෙවනු ලබන දේපල ණය වෙනුවෙන් රජයෙන් ගෙවිය යුතු 6% ක පොළිය ඇමුණුම 01 අනුව පළාත් භාණ්ඩාගාරයට එවීමෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගත යුතුය.

**04. ණය වාරික අයකිරීම ප්‍රේෂණය කිරීම**

නිලධාරීන්ගෙන් මාසිකව අයකරන ණය වෙනුවෙන් වාරික හා පොලිය සම්බන්ධයෙන් 122 අයවැය චක්‍රලේඛනයේ ඇමුණුම 02 ප්‍රකාරව අදාල බැංකුවේ කළමනාකරු වෙත මාසිකව ප්‍රේෂණය කර එහි පිටපතක් මා වෙතද එවිය යුතුය.

**05. පළාත් භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලද රජය විසින් ගෙවන ලද පොලියේ වෙනස**

සෑම මාසයක් අවසානයේදී දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යංශය විසින් ගෙවන ලද දේපළ ණය පොලියේ වෙනස මෙම චක්‍රලේඛනයේ 03 වන ඇමුණුමට අනුකූලව පිළියෙල කරන ලද වාර්තාවක් ඊළඟ මස 08 වැනි දිනට ප්‍රථම පළාත් භාණ්ඩාගාරය වෙත එවිය යුතුය.

**06.2005 වර්ෂය සඳහා ගෙවන ලද ණය වෙනුවෙන් රජය විසින් දරණ ලද පොලිය වෙනුවෙන් අතිරේඛ ප්‍රතිපාදන ඉල්ලා සිටීම.**

ඔබ ආයතනයේ 2005 වර්ෂයේ ගෙවන ලද දේපළ ණය සඳහා රජය වෙනුවෙන් ගෙවිය යුතු පොලිය අමුණා ඇති ඇමුණුම 04 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ලබාගත යුතුය.

**07. පොලිය ගිණුම්ගත කිරීම**

ඔබගේ ආයතනය විසින් එක් එක් නිලධාරියා වෙනුවෙන් අයකරන ලද මාසික වාරිකය හා පොලිය වෙන් වෙන්ව සි.සි.10 ලේඛනයේ අනෙකුත් ණය වලට බාහිරව වෙනම සටහන් කළ යුතුය. එහිදී රජය විසින් දැරූ 6% පොලිය හා 4% **නිලධාරීන්ගෙන් අයකළ යුතු පොලිය වෙන වෙනම පැහැදිලි ලෙස සටහන් කළ යුතු බව අවධාරණය කරමි**.

08. මෙම චක්‍රලේඛනයේ සඳහන් උපදෙස් වලට අනුව කටයුතු කරන ලෙසත් චක්‍රලේඛනයට අමුණා ඇති ආකෘති පත්‍ර නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරයට එවීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි

09.මේ පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් 025-2222446 ඇමතීමෙන් ලබා ගත හැකිය.



ජේ.ඒ.එම්.කරුණාරත්න,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත්:- 1. විගණකාධිපති, උතුරු මැද පළාත
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, උතුරු මැද පළාත